**ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය හා මට්ටක්කුලිය පරිශ්‍රයේ නේවාසිකාගාර පහසුකම් ලබාගන්නා සිසුන් අතර ඇති කරගනු ලැබූ ගිවිසුමයි**

ඒ කවරේද යත්

මින් පළමු පක්ෂය ලෙස ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ උපකුලපතිත් දෙවන පක්ෂය ලෙස මෙහි පහත තැනක සඳහන් කරන ශිෂ්‍යයෙකු වන

.................................... ශිෂ්‍ය අංකය දරණ හා ........................................................................ ලිපිනයේ පදිංචි ........................................................................2024............................ දින මට්ටක්කුලියේදී අත්සන් කරනු ලැබූ ගිවිසුමයි.

මෙහි පහත කොන්දේසි වලට යටත්ව දෙවන පක්ෂය වෙත මාස .......................... පමණ කාලයකට නේවාසිකාගාරයේ කාමරයක ඇඳක හා ජල විදුලි පහසුකම් පළමු පක්ෂය විසින් ලබාදෙනු ඇත. නැවත ගිවිසුම අළුත් කිරීමේදී සියළු හිඟ ගාස්තු ගෙවා තිබීම අනිවාර්යය වනු ඇත.

01. නේවාසිකාගාර පහසුකම් ලබාගැනීමේදී දෙවන පක්ෂය විසින් නැවත ලබාගත හැකි රු. 3000/- ක නේවාසිකාගාර තැම්පතුවක් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සේවා අංශය වෙත ගෙවිය යුතු වේ.

02. දෙවෙනි පක්ෂය විසින් මසකට රු. 1500/- ක නේවාසිකාගාර ගාස්තුවක් ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සේවා අංශය වෙත ගෙවිය යුතුය.

03. දෙවෙනි පක්ෂය විසින් එලෙස ගෙවීම් පැහැර හැරීමක් සිදුකරන අවස්ථාවක ඔවුන්ගේ උපාධි ප්‍රදානෝත්සවයට පෙර අදාල සියළු ගෙවීම් සිදුකර රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් පසුව පමණක් උපාධි ප්‍රදානෝත්සවයට හා උපාධි සහතිකය ලබාගැනීමට හැකි වනු ඇත.

04. දෙවෙනි පක්ෂය විසින් තමාගේ නේවාසිකාගාර කාමරයේ වෙනත් පිටස්තර පුද්ගලයින් නතර කරගෙන සිටීම ඔහුට නේවාසිකාගාර පහසුකම් අහිමි වීමට හේතුවක් වන අතර නැවත දෙවෙනි පක්ෂය වෙත නේවාසිකාගාර පහසුකම් ඉල්ලුම් කල නොහැක.

05. දෙවෙනි පක්ෂය විසින් නවක වදය හෝ වෙනත් සිවිල් සමාජයට අදාල නීති වලින් බැඳී පවත්නා යම් වරදකට හසුවුවහොත් ඔහුට නේවාසිකාගාර පහසුකම් නැවත හිමිනොවනු ඇත.

06. දෙවෙනි පක්ෂය විසින් නේවාසිකාගාර දේපළ වලට අලාභහානි සිදුකල හොත් එම අලාභයේ වටිනාකම උපාධි ප්‍රදානෝත්සවය හා/ හෝ උපාධි සහතිකය ලබාගැනීමට පෙර සියළු ඇස්තමේන්තු මුදල ගෙවීමට එකඟ විය යුතුය

07. නේවාසිකාගාර පරිශ්‍රය තුලට කාන්තාවන් රැගෙන ඒම හා පැමිණීමට අවස්ථාව සැලසීම විනයානුකූල පියවර ගැනීමට හේතුවක් වනු ඇත.

08. දෙවෙනි පාර්ශවය විසින් නේවාසිකාගාරය තුලට ප.ව. 10.00 ට පෙර පැමිණිය යුතුය.

පවත්නා අවම පහසුකම් යටතේ පමණක් පළමු පක්ෂය විසින් නේවාසිකාගාර පහසුකම් ලබාදෙන බව දෙවන පක්ෂය විසින් පිළිගන්නා බවත්, පහසුකම් වැඩිකරනු වස් විශ්වවිද්‍යාල පරිපාලනය වෙත පැමිණිලි නොකරන බවටත් දෙවන පක්ෂය ලෙස ශිෂ්‍ය ........................................................................... (නම) පිළිගනිමි. පළමු පක්ෂය විසින් කලින් කලට පවතින ප්‍රතිපාදන යොදාගෙන අළුත්වැඩියා කටයුතු සිදුකල යුතුය.

පළමු පක්ෂය

.................................................

උපකුලපති

දෙවන පක්ෂය

ශිෂ්‍ය නම ............................................................

ශිෂ්‍ය අංකය .........................................................

ශිෂ්‍ය අත්සන ....................................................

සාක්ෂි

...........................................

පීඨාධිපති

................................................

සහකාර ලේඛකාධිකාරී (ශිෂ්‍ය කටයුතු)

මා ඉදිරිපිටදී අත්සන් කරන ලදී.

.........................................................

ජයමුණි උපුල් සිසිර කුමාර පෙරේරා

මුළු දිවයිනටම සාම විනිසුරු